# සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

2 ශ්‍රේණිය - බුද්ධ ධර්මය - ජනවාරි මාසය - 4 වන සතිය

සැකසුම :- බලංගොඩ අධ්‍යාපන කලාපය.

## හොඳ දරුවෝ වෙමු.

පාට සුවඳ එක වගේ - තිබෙන රෝස මල වගේ

කීකරු හොඳ ළමයාගේ - කවුරුත් පවසති අගේ

පුතාලා දන්නවද ඒ කවියෙන් කියවෙන්නෙ කවුරු ගැනද කියලා. හොඳ ළමයා ගැන . ඉතිං දුවේ පුතේ අපි කොහොමද හොඳ දරුවන් හදුනාගන්නෙ.

මේ බලන්න හොඳ දරුවා නිතරම තෙරුවන් ගුණ සිහි කරනවා. ඔයාල දන්නවා තෙරුවන් නම් කරන්න.

බුද්ධ රත්නය , ධම්ම රත්නය , සංඝ රත්නය

ඊලගට හොඳ ළමයා පන්සල් ගියාම පසග පිහුටුවා හාමුදුරුවන්ට වදිනවා. හාමුදුරුවෝ දෙන අවවාද පිලිගන්නවා.

ඒ වගේම තමයි දෙමව්පියන්ට මව්පියන්ට කීකරුව ඒ අයට ගෞරවයෙන් සලකනවා.

එහෙනම් දුවලා පුතාලාට පුලුවන් හොඳ ළමයා කරන දේවල් හොයලා යා කරන්න.

- යහළුවනට උදව් කිරීම
- අසරණ අයට උදව් කිරීම
- හාමුදුරුවන් අසුන් ගන්නා ආසන වල වාඩි වීම.
- යහළුවන් සමග රණ්ඩු දබර කිරීම.
- තෙරුවන් නැමදීම.
- අවවාද කල විට පිළිගැනීම.
- දෙමව්පියන්ට වැදීම.

හොඳ ළමයා

මේ පාඩමට අදාළ වීඩියෝ පාඩම සදහා you tube එකට ගොස් Renuka kumari . හොඳ දරුවෝ වෙමු. ලෙස type කරන්න.

"හොදයි ආදරණිය දුවේ, පුතේ ඔයාලට තෙරුවන් සරණයි!"